# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
## நிதி, திட்டமிடல் அமைச்சு
## MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) - 11 - 2449823
වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: බීඩීජ්/965/1/494
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2008.04.04

**ජාතික අයවැය චක්‍රලේඛ අංක : 138**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

<u>අයවැය ප්‍රතිපාදන සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම</u>

අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ඇති දේශීය/විදේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි අරමුදල් නිදහස් කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් පවතින බව නිරීක්ෂණය වේ. අයවැය ඇස්තමේන්තුවල ව්‍යාපෘතියක් සඳහා අරමුදල් සලසා දෙනු ලබන්නේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඇගයීමකට ලක්කර, එම දෙපාර්තමේන්තුවේ නිර්දේශ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමෙන් පසු වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුලත් කර පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන අනුමත කිරීමේ ක්‍රියාවලිය තුලය.

එබැවින් මෙම ක්‍රියාපටිපාටිය අනුගමනය කොට ප්‍රතිපාදන සලසා ගත් ව්‍යාපෘති සඳහා අයවැය ඇස්තමේන්තු සම්මතවීමෙන් පසු නැවතවරක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ.

2008 වසරේ අයවැය කැඳවීමේ චක්‍රලේඛයෙහි `වියදම් කළමනාකරණ ක්‍රමවේදයන්'යටතේ මූලධන ව්‍යාපෘති සම්බන්ධව උපදෙස් ලබා දී ඇති අතර, මූලධන ව්‍යාපෘති සම්බන්ධව අනුගමනය කළ යුතු මූලික ක්‍රමවේදය පහත දක්වමි.

i. ඉදිරි වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සඳහා යෝජනා කරන නව ව්‍යාපෘති, ප්‍රතිපාදන වෙන් කර ගැනීමට පෙර ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

ii. විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා ඉහත නිර්දේශයට අමතරව විදේශ අරමුදල් පිළිබඳව සනාථ කර ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගත යුතුය.

iii. රුපියල් මිලියන 20 ට අඩු ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ප්‍රමාණවත් වන අතර රුපියල් මිලියන 20 ට වැඩි ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය.

iv. ඉහත පූර්ව අනුමැතිය සහිත ව්‍යාපෘති ඒවායේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අවශ්‍යතා අනුව අඩියරගත කොට අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන සඳහා ඉදිරිපත් කළ යුතුය.

v. ව්‍යාපෘතියක මුළු පිරිවැය ඇස්තමේන්තුවෙහි සංශෝධනය කිරීම් සඳහාද ඉහත නිර්දේශ සහ අනුමැතින් ලබා ගත යුතු අතර වාර්ෂික ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී එවැනි සංශෝධනද ප්‍රතිපාදන ඉල්ලීම්වල අන්තර්ගත වී තිබීම අනිවාර්ය වේ.

vi. ව්‍යාපෘතියක ක්‍රියාකාරී සැලැස්මට අනුව මුදල් අවශ්‍යතා පිළිබඳ පුරෝකථනයන් සිදු කළ යුතු අතර එය මුදා හැරීම සඳහා කාල වකවානු පිළිබඳ එකඟතාවයකට පැමිණීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

ඉහත ක්‍රියාපටිපාටියට බාහිරව අයවැය සම්මතවීමෙන් පසු කිසියම් ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය විය හැක්කේ පහත සඳහන් අවස්ථා වලදී පමණි.

i. අදාල වර්ෂයේ අයවැය කථාව මගින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා යටතේ අළුතින් ආරම්භ කරන නව ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු අවස්ථාවක.

ii. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති දැනට ක්‍රියාත්මක කිසියම් ව්‍යාපෘතියක අදාල ප්‍රතිපාදන ඉක්මවන අවස්ථාවක.

iii. ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට යටත්ව කිසියම් ව්‍යාපෘතියක් සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා තිබෙන වාපෘතියකට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු අවස්ථාවක.

තවද, ඉහත කී i, ii හා iii යන අවස්ථා යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ව්‍යාපෘති ඉදිරිපත් කිරීමට පෙර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා අයවැය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර එම යෝජනා සකස් කර මෙම අමාත්‍යාංශයේ එකඟතාවය මත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමෙන් මෙම ක්‍රියාවලිය වඩාත් ඉක්මන් කරගැනීම පහසුවන බව සඳහන් කරනු කැමැත්තෙමි.

ඉහත සඳහන් කරුණු පිළිබඳව හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුත්තේ කුමන ව්‍යාපෘති සඳහාද යන්න පිළිබඳව තව දුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ හෝ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ එම දෙපාර්තමේන්තුවල ඔබ අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරනු ලබන නිලධාරී වෙතින් අවශ්‍ය උපදෙස් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමි.

පී. බී. ජයසුන්දර
භාණ්ඩාගාර ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්

Ay. 2